# ගැමි ශාන්තිකර්මයන්හි ඇතුළත් ගරායක් සංකල්පය හා බැඳි මනෝචිකිත්සක ක්‍රමවේදයන් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යනයක්

**දිසානායක එච්. ඒ. එම්[1],තිලකසිරි පී.ඒ.ඒ.කේ[2], හේරත් එම්.කේ.එස්.[3]**

සිංහල ජන සමාජයේ ශාන්තිකර්මයන් සඳහා මූලික තැනක් හිමි වී ඇත. ඒ අතරින් දකුණු වෙරළබඩ කලාපයේ ගරායක් සංකල්පය වර්තමානයේ දී මනෝචිකිත්සක ක්‍රමවේදයක් ලෙස කෙතරම් දුරට භාවිතා වන්නේදැයි විමසීම මෙහි පර්යේෂණ අරමුණ යි. මේ සඳහා ක්ෂේත්‍ර අධ්‍යනයන් හා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යනය පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගැනිණ. දකුණු පළාතෙහි වෙරළබඩ වැසියන් වාරකන් කාලයේ දී මත්ස්‍ය අස්වැන්න වර්ධනය උදෙසා පවත්වන වර්තමානයේ දී ඉතා දුර්ලභ ශාන්තිකර්මයක් ලෙස මහ ගරා යකුන් යාගය හැඳින්වේ. මසුන් රංචු පිටින් වැඩි වශයෙන් දැල්වලට හසුවීමේ දර්ශනයන් දැකීමෙන් ඇස්වහ දෝෂ ඇති වේ යයි මතයක් ඔවුන් තුළ පවතී. මේ හේතු කොටගෙන මත්ස්‍ය අස්වැන්න අඩු වන බව විශ්වාස කරන අතර බාහිර පුද්ගලයන් විසින් තම මත්ස්‍ය අස්වැන්න දර්ශනය වීම වැළැක්වීමට කටයුතු කරයි. වාරකන් කාලසීමාවේ දී හිඟවන්නා වූ මත්ස්‍ය අස්වැන්න හේතු කොටගෙන මානසික පීඩනයකින් කල්ගෙවන ධීවරයාගේ මානසික තත්ත්වය සුවපත් කිරීමට ගරායක් ශාන්තිකර්මය සිදු කරනු ලබයි. මේ හේතු කොටගෙන ජනතාවගේ මානසික සුවය ඉහළ නංවනු ලබන මනෝචිකිත්සක ක්‍රමවේදයක් ලෙස ගරායකු ම භාවිතා කරයි. ගරා යකා විසින් වාරකන් කාලයේ දී සාගරය ගිල ගැනීම හේතු කොටගෙන තම මත්ස්‍ය අස්වැන්න අඩු වන බව විස්වාස කරයි. ගරායකාගේ බැල්ම වැටීමෙන් මානුෂික/අධිමානුෂික කිසිදු ආකාරයක ඇස්වහ දෝෂයන්ට ලක් නොවන බව විශ්වාස කරයි. ගරා යකා ස්වරූප දොළසකින් විද්‍යමාන වන බව මොවුන්ගේ මතය යි. සශ්‍රිකත්වය, වස්දොස් දුරු කිරීම, මත්ස්‍ය වර්ධනය ගරා යක්ෂයාගෙන් පොදු ජනයා අපේක්ෂා කරයි. මෙහි එන ලාගපොලේ නැටුම නම් අංගය තුළින් ගව සම්පත ආරක්ෂාව අපේක්ෂා කරයි. එසේ ම මානසික ව්‍යාධීන් දුරු කිරීම ද මෙම ගරායක් නැටීමෙන් බලාපොරොත්තු වෙයි. හාස්‍යමුසු වදන් භාවිතය මෙම ශාන්තිකර්මය පුරාවට ම බහුලව ම හඳුනාගත හැකි අතර මේ ආකාරයේ හාස්‍ය උද්දීපනයෙන් ජනයාගේ පීඩනයට ලක් වී ඇති මනස සැහැල්ලු කිරීමෙන් මනෝචිකිත්සක ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වෙයි. ඇස්වහ කටවහ හෝවහ ආදිය මනෝමූල පුද්ගල හා පොදු යහපත සඳහා බලපාන බවට සිංහල ජන සමාජයේ මතයක් පවති. මේවාගෙන් අත්මිදීමට ගැමි ශාන්තිකර්මයන් හා ඒ හා බැඳි අං කෙළිය, කතුරු ඔංචිල්ලා, පොරපොල් ආදී පත්තිනි දේවිය හා සබැඳි ජන ක්‍රීඩාවන්හි අවසානයේ ගරා යකුම සිදු කරන අතර මේවා හුදෙක් මනෝචිකිත්සක ක්‍රමවේදයන් ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව වර්තමානයේදී ද මනෝචිකිත්සක ක්‍රමවේදයක් වශයෙන් මෙම ප්‍රදේශයේ ජනයා තවදුරටත් ගරායක් ශාන්තිකර්මය යොදා ගන්නා බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** ශාන්තිකර්මය, මනෝචිකිත්සක, ගරායක්, වෙරළබඩ, මත්ස්‍ය

[1] සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. hashaniamd@gmail.com